*PRAVACANA: Refereed Journal of Bhiksu University of Sri Lanka, Vol. 16-Iss. I, Jan. 2025, 95-107.*
*DOI: https://doi.org/10.4038/p.v16i1.62*

# බුදුන් වහන්සේ භාවිත කළ ඉගැන්වීම් ආධාරක නූතන අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

# [A Study on the Possibility of Using Buddha's Teaching Aids to the Modern Education Process]

**Madugalle Sudaththa**[1]


## Abstract

In the current teaching and learning process, a special trend of using teaching and learning aids can be seen all over the world to successfully bring about the expected learning outcomes from the student. Before modern learning aids became popular, in the Buddha's philosophy of education, teaching and learning aids were utilised for successful teaching around the 6$^{th}$ century B.C. The main purpose of this research is to study how the teaching and learning aids used by the Buddha can be applied to the modern education process. The specific objectives of the research are to introduce teaching-learning aids, identify Buddha's teaching aids and study how those teaching-learning aids can be used in the modern education process. For this, context analysis under the qualitative research methodology was used. The main teaching aids used by the Buddha are natural environments, special materials related to the occasion, demonstrations of certain incidents such as movies, etc. As the special features of those teaching-learning aids can be recognized as using an available substance or event. It is used in a way that suits the diversity of individuals; and it requires no effort and no cost to prepare. Such aids are exemplary of the modern educational process. The use of natural objects outside the classroom, the use of school materials, the use of recordings appropriately to the occasion, the use of prepared materials before the learning event, and the creation of events and situations can also be used as teaching aids in modern education. It can be concluded that teaching-learning aids used by the Buddha, are appropriate for use in the modern teaching and learning process.


**Keywords**: Aids Used by the Buddha, Learning, Learning Aids, Load Buddha, Modern Education, Teaching and Learning Process

---

1. Lecturer, Department of Social Sciences and Comparative Studies, Bhiksu University of Sri Lanka.
E-mail:sudaththa12@gmail.com https://orcid.org/0009-0005-5737-5916

Received: 12 Feb. 2025, Accepted revised version: 16 June 2025.

This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

### හැඳින්වීම

පුද්ගලයා තුළ ප්‍රජානන, ආවේදන හා මනෝචාලක යන ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමෙන් පරිපූර්ණ පෞරුෂයක් සහිත පුද්ගලයෙක් බිහි කිරීම අධ්‍යාපනයෙන් අපේක්ෂා කරන අතර ඒ සඳහා කිසියම් ක්‍රියාවලියක් සිදු වේ. ආදාන සාධක [Input] (ශිෂ්‍යයා, ගුරුවරයා, ඉගෙනුම් ද්‍රව්‍යය), ක්‍රියාවලිය [Process] (ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය), ප්‍රතිදානය [Output] (පූර්ණ පෞරුෂයකින් සමන්විත පුද්ගලයෙක්) යන ක්‍රියාවලිය අධ්‍යාපනයේ දී හඳුනාගත හැකිය (Uchechi Bel-Ann Ordu, 2021). එම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා විවිධ ඉගැන්වීම් ක්‍රමවේද හා උපාය මාර්ග, ඉගෙනුම් ක්‍රමවේද, ඇගයීම් ක්‍රමවේද ආදිය යොදා ගනු ලැබේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායි කර ගැනීම සඳහා ඉගැන්වීම් උපාය මාර්ග අවශ්‍ය වේ. ඒ සඳහා ඉගෙනුම් ආධාරක භාවිතයට අධ්‍යාපනඥයෝ යොමු වෙති. මේ තුළින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙන් බලාපොරොත්තු වන ඉගෙනුම්ඵල සාර්ථකව ශිෂ්‍යයා කරා ළඟා කරවීමට හැකි වේ. මෙහි ඇති වැදගත්කම නිසාවෙන් ම ශ්‍රී ලංකාවේ පමණක් නොව බොහෝ රටවල ඉගෙනුම් ආධාරක භාවිතයෙන් ඉගැන්වීමේ නැඹුරුවක් දැකිය හැකි ය. විවිධ මනෝවිද්‍යාඥයන්, දාර්ශනිකයන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ඉගෙනුම් ආධාරක භාවිත කිරීමේ වැදගත්කම අවධාරණය කර ඇත. නමුත් වර්තමානයේ මෙම ක්‍රමය ප්‍රචලිත වීමට පෙර ක්‍රි.පූ. 6වන සියවසේ පමණ ඈත අතීතයේ දී ද සාර්ථක ඉගැන්වීමක් සඳහා ඉගෙනුම් ආධාරක යොදා ගෙන ඇති බව බුදුන් වහන්සේගේ දර්ශනයෙන් ප්‍රකට වේ. ඵලදායී ධර්ම සන්නිවේදනයක් උදෙසා බුදුන් වහන්සේ බහුල වශයෙන් විවිධ ඉගෙනුම් ආධාරක භාවිත කර ඇති බව පෙළ සාහිත්‍ය අධ්‍යයනයෙන් හඳුනාගත හැකි ය.

### පර්යේෂණ ගැටලුව

ඉගැන්වීමේ දී ගුරුවරයාට ලිඛිත තොරතුරු, වගු ප්‍රස්තාර, දෘශ්‍ය හා ශ්‍රව්‍ය වැනි විවිධ ආකාරයේ ඉගෙනුම් තොරතුරු ඉගෙනුම්ලාභියා වෙත සම්ප්‍රේෂණය කිරීමට සිදු වේ. විවිධ ඉගෙනුම් ශෛලීන්ගෙන් සමන්විත ශිෂ්‍යයන් පංතිකාමරයේ දී නිරන්තරයෙන් හමු වේ. නේල් විසින් (Neil Fleming’s VARK Model) ඉදිරිපත් කරන ලද ඉගෙනුම් ශෛලියේ දී ශිෂ්‍යයන් ඉගෙන ගන්නා ආකාර හතරක් දක්වා ඇත (Tomić, Rastovski & Ćurić, 2023). දෘශ්‍ය ආධාරක ඇසුරින් ඉගෙන ගන්නා සිසුන් (Visual); ශ්‍රවනය කිරීමෙන් ඉගෙන ගන්නා සිසුන් (Auditory); කියවීමෙන් හෝ ලිවීමෙන් ඉගෙන ගන්නා සිසුන් (Reading/writing preference); චාලක ක්‍රියාකාරකම්වලින් ඉගෙන ගන්නා සිසුන් (kinesthetic) ආදි වශයෙනි. මෙම ආකාරයේ විවිධ ඉගෙනුම් ශෛලීන්ගෙන් සමන්විත සිසුන්ට ග්‍රහනය වන ආකාරයෙන් ඉගැන්වීම ඉතා අපහසු කාර්යයකි. මේ සඳහා ඉතා යෝග්‍ය ඉගැන්වීම් උපක්‍රමයක් ලෙස ඉගෙනුම් ආධාරක භාවිතය හඳුන්වා දිය හැකිය.

නමුත් මෙම ක්‍රියාවලියේ දී ඉගෙනුම් ආධාරක භාවිත කිරීම ගුරුවරුන්ට ආධුනික කාර්යයක් බවට පත්ව ඇති අතර ඒ සඳහා විවිධ ඉගෙනුම් ආධාරක සකස් කිරීම හා භාවිතය අභියෝගාත්මක කාර්යයක් සේ සැලකේ. ඉගෙනුම් ආධාරක සකස් කිරීමට ගත වන කාලය, වියදම, ශ්‍රමය ආදිය අධික වීම ද ඒ සඳහා හේතු වේ. ඒ සඳහා පිළියමක් ලෙස මීට වසර 2500 කට පමණ පෙර බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරකවල ස්වභාවය හඳුනා ගෙන ඒවායේ ධනාත්මක ලක්ෂණ නූතන අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගත හැකි වනුයේ කෙසේ ද? යන්න විමසීම පර්යේෂණයේ ගැටලුව වේ.

### සාහිත්‍ය විමර්ශනය

නූතනයේ භාවිත වන ඉගෙනුම් ආධාරක

පිළිබඳ පර්යේෂණ බහුල ව හඳුනාගත හැකිය. නමුත් බුදුන් වහන්සේ විසින් භාවිත කරන ලද ඉගෙනුම් ආධාරක පිළිබඳ හෝ ඒවා නූතන අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගත හැකි ආකාරය පිළිබඳ සිදු වී ඇති පර්යේෂණ ඉතා අවම මට්ටමක පවතී.

හැවැන්පොල රතනසාර හිමි විසින් (1969) රචනා කරන ලද 'බෞද්ධ අධ්‍යාපන දර්ශනය' නම් කෘතියේ දී බෞද්ධ අධ්‍යාපන සංකල්ප පිළිබඳ, පැරණි බෞද්ධ අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු සංග්‍රහ කර ඇති නමුත් බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරක පිළිබඳ කරුණු අන්තර්ගත නොවේ.

'බෞද්ධ අධ්‍යාපන ප්‍රවේශය' නමින් පාතේගම ඤාණිස්සර හිමි විසින් (2006) කරන ලද කෘතිය ද අධ්‍යාපනය පිළිබඳ ව බෞද්ධ විවරණය, බෞද්ධ අධ්‍යයන විෂය මාලාව, බෞද්ධ අධ්‍යාපනයේ අරමුණු සහ පරමාර්ථ, බුදුරජාණන් වහන්සේගේ අවධියේ පටන් බෞද්ධ අධ්‍යාපනයේ ස්වභාවය හා ඓතිහාසික විකාශය ද විවරණය කර තිබෙනමුත් ඉගෙනුම් ආධාරක පිළිබඳ අවධානය යොමු වී නැත.

පැලැන්වත්තේ ධම්මතිලක හිමි (2017) විසින් රචිත 'බෞද්ධ අධ්‍යාපන දර්ශනය' නම් කෘතිය, එච්.එම්.ටී.බී. හේරත් (2014) විසින් රචිත 'බුදු දහමින් හෙළිවන අධ්‍යාපන සංකල්ප' නම් කෘතිය, 'සම්බුද්ධ දේශන විලාසය' නමින් දොරලියද්දේ ධම්මකිත්ති හිමි (2006) විසින් කරන ලද කෘතිය, චන්ද්‍රා ජයකොඩි (2005) විසින් කරන ලද 'බුද්ධ දේශනාවෙන් ඉගැන්වෙන අධ්‍යාපන ක්‍රම ශිල්ප' නම් කෘතිය, 'බුදු දහමින් පිළිබිඹු වන ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම' නමින් ඇකිරියගල නන්ද හිමියන් (1999) විසින් කරන ලද කෘතිය, හැරී අබේසේකර හා විනීතා අබේසේකර (2015) විසින් කරන ලද 'බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් ක්‍රම' නම් ග්‍රන්ථය ආදිය බෞද්ධ දර්ශනය පදනම් කර ගෙන එහි විද්‍යමාන අධ්‍යාපනික අගය පිළිබඳ රචනා වී ඇති නමුත් බුදුන් වහන්සේ විසින් භාවිත කරන ලද ඉගෙනුම් ආධාරක පිළිබඳ කරුණු ගවේශනය සිදු වී නොමැති තරම් ය.

එම නිසා මෙම පර්යේෂණයේ දී බුදුන් වහන්සේ විසින් භාවිත ඉගෙනුම් ආධාරක පිළිබඳ පවතින ශාස්ත්‍රීය පර්යේෂණ හිඩැස ආවරණය කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා පෙළ සාහිත්‍ය අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන අතර ඒ හා සමගාමී ද්විතීයික ග්‍රන්ථ පරිශීලනයට ද අපේක්ෂිත ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ග්‍රන්ථ සන්ධාර විශ්ලේෂණය ක්‍රමය භාවිත කරන අතර පෙළ සාහිත්‍ය අධ්‍යයනය කිරීම හා මාතෘකානුබද්ධ ද්විතීයික ග්‍රන්ථ අධ්‍යයනය ද සිදු කරනු ලැබේ. පර්යේෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම පර්යේෂණ අරමුණු පාදක ව සිදු කිරීමට අපේක්ෂිත ය.

**පර්යේෂණ අරමුණ**

'බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරක නූතන අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගත හැකි ආකාරය විමසීම' මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර එය සාධනය කර ගැනීම සඳහා සුවිශේෂ පර්යේෂණ අරමුණු 3ක් උපයෝගී කර ගෙන ඇත.

1. ඉගෙනුම් හා ඉගැන්වීම් ආධාරක හඳුනා ගැනීම
2. බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරක කවරේදැයි හඳුනා ගැනීම
3. බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරක නූතන අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගත හැකි ආකාරය විමසීම

මෙම සුවිශේෂ අරමුණු පාදක කර ගෙන පර්යේෂණය සිදු කරනු ලැබේ.

**පර්යේෂණ ප්‍රතිඵල සහ සාකච්ඡාව**

**ඉගෙනුම් හා ඉගැන්වීම් ආධාරක හඳුනා ගැනීම**

**ඉගෙනුම් හා ඉගැන්වීම් ආධාරක නිර්වචනය**

ඉගෙනුම් ආධාරක යනු යම් ඉගැන්වීමක් ඉදිරිපත් කිරීම සඳහා ගුරුවරයා භාවිත කරන මෙවලමකි. ගුරුවරයා ශිෂ්‍යයා වෙත තොරතුරු සම්ප්‍රේෂණය කිරීම ඉගැන්වීමේදී සිදු වේ. එම සම්ප්‍රේෂණය වඩා පොහොසත්, ඵලදායී, කාර්යක්ෂම හා ආකර්ශනීය වූවක් බවට පත් කරගනු පිණිස ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක භාවිත කරයි (තිලකරත්න බණ්ඩා, 2007: 184).

ඉගෙනුම් ආධාරක පිළිබඳ විවිධ නිර්වචන සමූදායක් හඳුනා ගත හැකිය. ඉගෙනුම් ආධාරක යනු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමේ දී ගුරුවරයාට උපයෝගී වන උපදේශන ද්‍රව්‍ය හා උපකරණ වේ (Kapur, 2018). රැන්ඩම් හවුස් ශබ්දකෝෂයට (Random House Dictionary, 2017) අනුව 'ඉගෙනුම් ආධාරක යනු ගුරුවරයෙකු විසින් පංතිකාමර උපදෙස් සඳහා හෝ සිසුන්ගේ උනන්දුව උත්තේජනය කිරීම සඳහා භාවිත කරන ද්‍රව්‍යයන් ය.' යනුවෙන් කාපූර් තම ලිපියේ දී (Kapur, 2018) දක්වයි. මේ අනුව ඉගෙනුම් ආධාරක යනු ගුරුවරයා විසින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා භාවිත කරන ද්‍රව්‍ය හෝ උපකරණයන් ය.

බොහෝ ඉගැන්වීම් ආධාරක ක්‍රීඩා ලෙසින් භාවිත කළ හැකි බැවින් සිසුන් උත්තේජනය කිරීමට හෝ කාංසාව හෝ කම්මැලිකම ඉවත් කිරීමට ද භාවිත කළ හැකි ය. එමෙන් ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී උගන්වන කරුණු ළමුන්ට අවබෝධ කරවීම හා ධාරණය කරවීම ප්‍රධානම ගැටලුවකි. මෙම ගැටලුව විසඳීම සඳහා ඉගෙනුම් ආධාරක භාවිතයට බොහෝ රටවල් පෙළඹී ඇත.

ඉගෙනුම් ආධාරක ශිෂ්‍යයාගේ ඉගෙනීම වර්ධනය අරමුණු කරන අතර සාම්ප්‍රදායික පාඨ ග්‍රන්ථ මූලික කර ගනිමින් ක්‍රියාත්මක කළ අධ්‍යාපනයට වඩා ඉගෙනුම් අත්දැකීම් ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීමට මෙම ඉගෙනුම් ආධාරක වර්තමානයේ භාවිත වේ. එහි දී ශිෂ්‍යයාට සංයුක්ත අත්දැකීම් සම්ප්‍රේෂණය වන නිසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ එය අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. බර්ට්‍රන් රසල් දක්වන උදාහරණයෙන් ද එය පැහැදිලි වේ.

''ලෝකයේ මුහුදු තුඩු ලැයිස්තුව කවදාවත් මට මතක තබා ගත නොහැකි වීය. ලොව වටා ගමන් කරන නැවක් පිළිබඳ චිත්‍රපටයකින් ඒවා පිළිබඳව ඉක්මනින් ඉගෙනීමට ළමුනට අවස්ථාව සලසා දිය හැකිය. ඒවා දැන ගැනීමෙන් ප්‍රයෝජනයක් අත්වේ නම් මුහුදු තුඩු ගැන ඉගැන්විය යුත්තේ ඒ ආකාරයට ය'' (තිලකරත්න බණ්ඩා, 2007: 183).

තව ද ඉගෙනුම් ආධාරක භාවිතයේ වැදගත්කම් රාශියකි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සහභාගී වන බොහෝ සිසුන්ට ගැළපෙන ආකාරයෙන් ඉගැන්වීමට උපකාරී වීම, කිසියම් සංකල්පයක් නිදර්ශනය කිරීම හෝ ශක්තිමත් කිරීමට, නව හා ආකර්ෂණීය ආකාරයකින් තොරතුරු ඉදිරිපත් කිරීමෙන් කාංසාව හෝ කම්මැලිකම ඉවත් කිරීමට උපකාරී වීම, නිතර නිතර අමතක වීමේ ප්‍රවණතාවක් ඇති සිසුන්ට සංකල්ප වඩාත් ස්ථිරව හා පහසුවෙන් රඳවා ගැනීමට උපකාර වීම, ඉගෙනීම වේගවත් හා නිවැරදි කිරීම වැනි ප්‍රතිලාභ සමූහයක් ඉගෙනුම් ආධාරක භාවිතයෙන් ලැබේ.

මෙයින් පැහැදිලි වනුයේ ඉගෙනුම් ආධාරක යනු ශිෂ්‍යයාට යම් කරුණක් පැහැදිලි කිරීම උදෙසා, ලබා දෙන දැනුම ස්ථිර මතකයට එකතු කිරීම සඳහා, ගැඹුරු කරුණු සරළ

ව පැහැදිලි කිරීම සඳහා, ශිෂ්‍යයාට ලබා දෙන සංයුක්ත අත්දැකීම් වැඩි කිරීම සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කරන ප්‍රධාන මෙවලමක් බවයි.

**ඉගෙනුම් ආධාරක වර්ග**

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත වන ඉගෙනුම් ආධාරක ප්‍රධාන ක්‍රම 3ක් යටතේ වර්ග කළ හැකි ය.

i. ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක (Audio Aids)

ii. දෘශ්‍ය ඉගෙනුම් ආධාරක (Visual Aids)

iii. ශ්‍රව්‍ය හා දෘශ්‍ය ඉගෙනුම් ආධාරක (Audio-Visual Aids) (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, 1989( 45)

I. **ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක**

ඇසීමෙන් ඉගෙන ගැනීම සඳහා භාවිත කරන ආධාරක ශ්‍රව්‍යාධාරක නම් වේ. ඉගැන්වීම් උපකරණ, ගුවන් විදුලි යන්ත්‍ර, පටිගත යන්ත්‍ර, භාෂාගාර ආදිය මෙහිදී භාවිතයට ගැනේ.

II. **දෘශ්‍ය ඉගෙනුම් ආධාරක**

ශබ්දයකින් තොර රූප රාමු පමණක් භාවිතයෙන් නැතහොත් ඇසින් දැකීමෙන් පමණක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීම සඳහා භාවිත ආධාරක දෘශ්‍ය ඉගෙනුම් ආධාරක නම් වේ. සෙලවෙන පින්තූර, ප්‍රක්ෂේපන යන්ත්‍ර (Projector), හඬ රහිත චිත්‍රපට ඛණ්ඩ (Filmstrip), ඡායාරූප, චාට්ස්, රූප සටහන්, කාඩ්ස්, සිතියම්, ප්‍රස්ථාර, ආකෘති, කළු ලෑල්ල, නියම වස්තු (ඝණකය, චතුස්තලය ආදිය), කාටූන් චිත්‍ර ආදිය දෘශ්‍ය ඉගෙනුම් ආධාරක ගණයට අයත් වේ.

**III. ශ්‍රව්‍ය හා දෘශ්‍ය ඉගෙනුම් ආධාරක**

ශ්‍රව්‍ය හා දෘශ්‍ය ඉගෙනුම් ආධාරක යනුවෙන් හඳුන්වන්නේ ඇසීමට හා දැකීමට හැකියාව ඇති ආධාරකයි. මේවායේ දී මූලිකව රූප හා ශබ්ද ද්වයම භාවිත කෙරේ. වීඩියෝ, චිත්‍රපට, කැසට්, රූපවාහිණී, විද්‍යාගාර මෙවලම්, ක්ෂේත්‍ර චාරිකා ආදි වූ ආධාරක මේ සඳහා නිදසුන් වේ.

මෙම ඉගෙනුම් ආධාරක වර්ගවලට අමතර ව වෙනත් වර්ගීකරණයක් පහත වේ.

I. සාම්ප්‍රදායික ආධාරක (Traditional Aids)

II. දෘශ්‍යාධාරක (Visual Aids)

III. යාන්ත්‍රික ආධාරක (Mechanical Aids) (Ugcnetpaper1 team, 2019)

I. **සාම්ප්‍රදායික ආධාරක**

මෙහි දී භාවිත කරනුයේ පොත්, කලු ලෑල්ල/හුණු පුවරුව, වාර සඟරා ආදියයි. මෙම ක්‍රමවේදය තුළින් ශිෂ්‍යයාට ඉගෙනුම් අත්දැකීම් ලබා දීම තරමක් අසීරු ය. පැරණි සමාජයේ බොහෝ සෙයින් භාවිත වූයේ මෙම ආධාරක නිසාවෙන් එවැනි ආධාරක සාම්ප්‍රදායික ආධාරක යනුවෙන් හඳුන්වනු ලැබේ.

II. **දෘශ්‍යාධාරක**

පින්තූර, ප්‍රස්ථාර, ආදර්ශක, රූප සටහන්, කාටූන්, නිවේදන පුවරු, සිතියම් ආදි වූ ඇසට පෙනීමෙන් පමණක් දැනුම වර්ධනය පිණිස යොදා ගන්නා ආධාරක දෘශ්‍යාධාරක නම් වේ. මෙහි දෘශ්‍ය යන පදයෙහි අර්ථය ද දැකීම යන්නයි. ඒ අනුව ඇසට පෙනීම සඳහා සකස් කරන ආධාරක දෘශ්‍යාධාරක නම් වේ.

III. **යාන්ත්‍රික ආධාරක**

යාන්ත්‍රිකාධාරක පැරණි සමාජයේ හඳුනා ගැනීමට නොතිබුණු අතර ඒවායේ දී අත්කම් නිර්මාණ යොදා ගෙන ඇත. වර්තමානයේ තාක්ෂණ දියුණුව නිසාවෙන්ම යාන්ත්‍රික ආධාරක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගනු ලැබේ. එවැනි ක්‍රම කොටස්

3ක් යටතේ දැක්විය හැකි ය. එනම් මුලින් සඳහන් කරන ලද ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක, දෘශ්‍ය ඉගෙනුම් ආධාරක හා ශ්‍රව්‍ය-දෘශ්‍ය ඉගෙනුම් ආධාරක වශයෙනි.

**බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරක**

බුදුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට ධර්ම දේශනා සිදු කරන අවස්ථාවන්හි විවිධ ක්‍රමවේද අනුගමනය කර ඇත. කිසියම් කරුණක් ග්‍රහනය කර ගන්නා ආකාරය අනුව පුද්ගලයින් වර්ග 3ක් නෙයය පුද්ගල සූත්‍රයෙහි දක්වා ඇත. උග්ගටිතඤ්ඤූ, විපටිතඤ්ඤූ, ඤෙය්‍ය හා පදපරම යනුවෙනි (අ.නි., චතුක්ක නිපාත, 2006). බුදුන් වහන්සේ මෙවැනි පුද්ගලයන්ට ධර්මය දේශනා සිදු කරන අවස්ථාවන්හි විවිධ ක්‍රමවේද අනුගමනය කිරීම දක්නට හැකි අතර එහි ප්‍රධාන අරමුණ ශ්‍රාවකයාට සාර්ථකව ධර්මාවබෝධය ලබා දීමයි.

ලෞකික ජීවිතයේ ඇලී ගැලී සිටින සත්ත්වයා නිර්වාණගාමී ප්‍රතිපදාවට යොමු කිරීම සඳහා නිසි මග පෙන්වීමට බුදුන් වහන්සේ ඒ ඒ චරිතයට හා මානසික මට්ටමට ගැළපෙන ආකාරයෙන් ධර්මය දේශනා කර ඇත. ගැඹුරු ධර්ම කරුණක් තවදුරටත් පැහැදිලි කිරීම, ස්වයං අත්දැකීම් ආශ්‍රයෙන් ස්වයං අවබෝධය සිදු කිරීම, ධර්ම කරුණු ආකර්ෂණීය හා ආස්වාදජනක අයුරින් ඉදිරිපත් කිරීම ආදී මූලික අභිප්‍රායන් සඳහා බුදුන් වහන්සේ විසින් ඉගෙනුම් ආධාරක භාවිත කර ඇත.

බුදුන් වහන්සේගේ සිය පංති කාමරය සඳහා නිශ්චිත ස්ථානයක් නොවී ය. එය උයන් බිම් හෝ සොහොන් බිම් හෝ කෙතක් හෝ ගංගාවක් අසබඩ හෝ මහා වනයක හෝ රුක්මුල්, ගොමු මුල හෝ ගල් තලා හෝ වැලි තලා හෝ දුගී පැල්පත හෝ මඟතොට හෝ වීය. එම නිසාවෙන් උන්වහන්සේගේ ඉගෙනුම් ආධාරක ද බොහෝ සෙයින් ඒ අසල ඇති යම් ද්‍රව්‍යයක් හෝ යම් සිද්ධියක් හෝ ස්ථානයක් හෝ වීය.

බුදුන් වහන්සේ එවැනි ඉගෙනුම් ආධාරක භාවිත කරන ලද අවස්ථා පෙළ සාහිත්‍යයෙන් බහුලව හඳුනාගත හැකි ය. ඉන් එක් අවස්ථාවක් සේ චුල්ලපන්ථක හිමියන්ට ධර්මාවබෝධය ලබා දීම සඳහා ආශ්‍රය කර ගන්නා ලද වස්ත්‍රය දැක්විය හැකි ය. එහි දී පුද්ගල වර්ගීකරණයට අනුව චුල්ලපන්ථක හිමියන් දන්ධ (මෝඩ) ගති ඇති භික්ෂුවකි. ධර්මය ඇසීමෙන් හෝ කියවීමෙන් හෝ අවබෝධ කර ගැනීමට අපහසු භික්ෂුවකි. එම නිසා බුදුන් වහන්සේ චුල්ලපන්ථක භික්ෂුවට පිරිසිදු රෙදි කැබැල්ලක් දී ඒ දෙස නෙත් යොමා වස්ත්‍රය අතින් පිරිමදින ලෙසට උපදෙස් දුන් අතර චුල්ලපන්ථක හිමි තම අතින් පිරිසිදු වස්ත්‍රය පිරිමැදීම නිසා වස්ත්‍රය අවපැහැ ගැන්වෙන ආකාරය දැක ඒ නිමිති කර ගනිමින් ආත්මභාවය ද එසේ කිළිටි වන ආකාරය අවබෝධ කර ගනිමින් සිත කෙලෙසුන්ගෙන් මුදවා ගන්නා ලදී (අපදාන පාලිය, 2005: 102-106). මෙම අවස්ථාව බුදුන් වහන්සේ ද්‍රව්‍යාධාරක භාවිත කරන අවස්ථාවක් සේ දැක්විය හැකි අතර එයින් ඉගෙනුම් ආධාරකවල සුවිශේෂත්වය, වැදගත්කම මනාව පිළිබිඹු වේ.

ආධාරක භාවිතයේ තවත් අවස්ථාවක් ලෙස කිසා ගෝතමී තෙරණියට අබ මිටක් රැගෙන ඒමට අනුදැනීම දැක්විය හැකි ය. තම පුතු මිය ගිය ශෝකයෙන් පෙළුණු කිසා ගෝතමී පුතු සුව කර ගැනීම උදෙසා බුදුන් වහන්සේ වෙත එළඹි විට බුදුන් වහන්සේ පුතු සුව කිරීමට නොමළ ගෙයකින් අබ මිටක් රැගෙන එන ලෙස වදාළහ.

''න විජ්ජන්තෙ මතා යස්මිං
ගෙහෙ සිද්ධත්ථකං තතො

ආහාරා'ති ජිනො ආහ
විනයොපායකොවිදො''
(අපදානපාළිය, 2005: 120)

යනුවෙන් නොමළ ගෙයකින් අබ මිටක් රැගෙන ඒමට කිසා ගෝතමී යැවූ අතර

එවැනි නිවසක් සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මරණය සියලු දෙනාට ම පොදු ධර්මයක් ලෙස අවබෝධ කර ගනිමින් පැවිදි දිවියට පත්ව නොබෝ කාලයකින් අරහත් භාවයට පැමිණියා ය.

මෙහි දී බුදුන් වහන්සේ ඉගෙනුම් ආධාරකය ලෙස යොදා ගනු ලැබූයේ අබ මිටකි. එයින් ක්‍රියාකාරී අත්දැකීමක් මත පිහිටුවා බුදුන් වහන්සේ කිසා ගෝතමීට ධර්මාවබෝධය ලබා දීමට උත්සුක වී ඇති බව පැහැදිලි වේ.

නන්ද කුමාරයාට ධර්මාවබෝධය ලබා දීම සඳහා ද බුදුන් වහන්සේ භාවිත කළේ ඉගැන්වීම් ආධාරකයකි. නන්ද කුමාරයා බුදුන් වහන්සේගේ ආයාචනය නිසාවෙන් පැවිදි වුව ද තමාගේ රූමත් බිරිඳ සිහිවීම නිසා ධර්මය සිහි කිරීමක් කිසිදු විටක සිදු නොවී ය. මේ නිසාවෙන් බුදුන් වහන්සේ ආධාරකයක් ලෙස රූමත් දිව්‍යාංගනාවක් මවා ක්‍රමානුකූලව වියපත්ව වැහැරී යන ආකාරය මැවූ සේක.

''සකෙන ආනුභාවෙන ඉත්ථිං මාපෙසි සොභනිං
දස්සනීයං සුරුචිරං මමතොපි සුරූපිනිං''
(අපදානපාළිය, 2005: 138)

ආදි වශයෙන් දැක්වෙන පරිදි ඉතාමත් රුචිර ස්ත්‍රියක් මවා ක්‍රමානුකූලව වැහැරුණු ශරීරය ඇති කුණු දුගඳ පැතිරෙන කාන්තාවක් බවට ඇය පත් කොට ජීවිතයේ අනියත බව පසක් කරවන ලදී. එයින් නන්ද කුමාරයාගේ රාගික සිත මඬනා ලද්දේ, ධර්මයෙහි උත්සුක කරවී ය.

මෙහි දී භාවිත කරන ලද ආධාරකය බුදුන් වහන්සේගේ ආනුභාවයෙන් මැවූ රූමත් ස්ත්‍රී රුවයි. මෙලෙසින් බුදුන් වහන්සේ විවිධ ඉගෙනුම් ආධාරක ඇසුරින් ධර්මය දේශනා කිරීම හා අවබෝධ කරවීම දැකිය හැකි ය.

බුදු දහමේ පැහැදිලි වන තවත් සුවිශේෂ ඉගෙනුම් ආධාරකයක් ලෙස දස කසිණයට අදාළව නිර්මාණය කරන ලද ආධාරක දැක්විය හැකි ය. මෙහි දී පඨවි, ආපෝ, තේජෝ, වායෝ, නීල, පීත, ලෝහිත, ඕදාත, ආකාස හා විඤ්ඤාණ ආදි දස කසිණ චිත්ත සමාධිගත කර ගැනීමට ආධාරකයක් සේ භාවිත වෙයි (සුත්ත පිටකය, 2005: 84).

නිදසුනක් ලෙස නීල කසිණයේ දී නිල් පැහැති වර්ණය අරමුණු කර ගනිමින් සිත සමාධිගත කිරීම දැකගත හැකි ය. එහි දී නිල් පැහැති රෙදි කැබැල්ලක් ගෙන එක් වියත් සතර අඟලක ප්‍රමාණයේ රවුමක් පිළියෙල කරගනු ලැබේ. එම සකසාගත් කසිණ මණ්ඩලය දෙස බලා එම වර්ණය මෙනෙහි කිරීමෙන් සිත සමාධිගත කරගනු ලැබේ. මෙලෙසින් අනෙක් කසිණයන් සඳහා ද ආධාරක අනුගමනයෙන් සිත සමාධිගත කිරීම දැකිය හැකි ය.

දස අසුභ භාවනාව තුළ දී ද බුදුන් වහන්සේ අනුදැන වදාළේ, මළ සිරුරක් ගෙන එහි ස්වභාවය පිළිබඳ නුවණින් දැකීමෙන් ජීවිතයේ ඇති අසාර බව අවබෝධ කර ගැනීමට ය. එහි දී මළ සිරුරක් නොමැති නම් ඒ හා සම්බන්ධ චිත්‍ර හෝ යොදා ගෙන මෙම භාවනාව සිදු කළ හැකි ය. ඒ අනුව පැහැදිලි වන්නේ මෙහි ප්‍රධාන ආධාරකය ලෙස භාවිත වන්නේ මළ සිරුර හෝ ඒ හා සබැඳි චිත්‍රයයි (දීඝනිකාය II, 2005: 448-461). බුද්ධානුස්සති භාවනාව වැඩීම සිදු කරනුයේ බුදු රුව ආධාරකයක් ලෙස යොදා ගනිමිනි.

තව ද රූපයෙන් මාන්නයට පත්ව සිටි බිම්බිසාර රජුගේ අගබිසවක වූ ඛේමාට අනියත බව පසක් කිරීම සඳහා යොදා ගනු ලැබුයේ ද ඉගෙනුම් ආධාරකයකි. එනම් බුදුන් වහන්සේ වෙත එළඹි ඛේමාවන්ට වඩා රූප සෝභාවෙන් උසස් වූ ස්ත්‍රියක් මැවී ය. එම මැවූ ස්ත්‍රිය බුදුන් වහනසේගේ පසෙක සිටිනා සේ පෙනීමට සලස්වා

ඛේමාගේ සිතෙහි ඇති මාන්නය බිඳ හෙළීමට ක්‍රමානුකූලව හම රැළි වැටෙන ආකාරය, කෙස් කළඹ සුදු වන ආකාරය, සිරුර ක්‍රමයෙන් වියපත් වන සැටි පෙන්වා කාන්තාව එතැනම මිය යෑම පෙන්වූ අතර ඉන් පසුව මළ සිරුර ඇට සැකිල්ලක් බවට පත් වන ආකාරය ද දර්ශනය කොට රූපයෙහි අස්ථිර භාවය පෙන්වා දුන් සේක. අනතුරුව ඛේමා තෙරණිය රූපයෙහි අස්ථිරත්වය අවබෝධයෙන් පැවිදි දිවියට පත්ව අරහත් ඵලයට පැමිණියා ය (අපදාන පාළිය, 2005: 72-85). මෙහි ඉගෙනුම් ආධාරකය ලෙස යොදා ගනු ලැබුයේ බුදුන් වහන්සේගේ ආනුභාවයෙන් මැවූ රූමත් කාන්තාවය. ඒ ඇසුරින් ජීවිතයේ ස්වභාවය අස්ථිරත්වය පෙන්වීම සිදු කරන ලදි.

එලෙස ම බුදුන් වහන්සේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී ද ඉගෙනුම් ආධාරකයක් භාවිත කරන අවස්ථාවක් දැකිය හැකි ය. එහි දී රාහුල හිමියන් වැඩ වසන කුටියට බුදුන් වහන්සේ වඩින අතර රාහුල හිමි බුදුන් වහන්සේගේ පා දෝවනය කළහ. ඉන්පසු වතුර ස්වල්පයක් භාජනයේ ඉතිරි වූ අතර එම භාජනය ආධාරකයක් ලෙස ගනිමින් බුදුන් වහන්සේ ධර්මය දේශනා කළ සේක. එහි දී,

''රාහුලයෙනි, තෙපි දියබඳුනෙහි තුබූ මේ අල්ප වූ උදකශේෂය දක්නවුදැ'යි.

එසේය, ස්වාමීනි.

රාහුලය, යම් භික්ෂුවක් දැන දැන බොරු කීමෙහි ලජ්ජාවක් නැද්ද, ඔහුගේ මහණකම ද මෙසේ ස්වල්පයකි'' (මජ්ඣිමනිකාය II, 2005: 130 -131).

ආදි වශයෙන් භික්ෂුත්වය හා මුසාව පිළිබඳ කරුණු පැහැදිලි කිරීම බුදුන් වහන්සේ එතැන තිබූ වතුර සහිත භාජනය ආධාරක කර ගනිමින් සිදු කරන ලදී.

කෘෂිකර්මාන්ත කටයුතුවල නිරතවෙමින් සිටි කසීභාරද්වාජ බමුණු තෙමට කෙත් යාය පංති කාමරයක් කර ගනිමින් කෘෂිකර්මාන්තය හා සම්බන්ධ විවිධ උපකරණ, ඉගෙනුම් ආධාරක බවට පත් කර ගනිමින් ධර්මය ඉගැන්වීම් කටයුතු සිදු කරන ලදහ. එහිදී නගුල, සීවැළ මෙන් ම සී සෑම, ගොවියා, ධාන්‍යය හා ගවයන් ආධාරක ලෙස භාවිත කරමින් ඉතා ගැඹුරු දහමක් සරළ ලෙස ඉගැන් වූ ආකාරය දැකිය හැකිය (ඛුද්දක නිකාය, 2005: 22-28).

තවත් අවස්ථාවක් ලෙස බුදුන් වහන්සේ වන පියසකට පැමිණි විට එහි ඇති තුරු ලතාවන්හි කොළ ස්වල්පයක් අතට ගෙන, මහ පොළොවෙහි පස් සිය නිය අගට ගෙන එම ද්‍රව්‍යයන් ඉගෙනුම් ආධාරකයක් බවට පත් කරමින් තමන් දෙසූ දහම් හා නොදෙසූ දහම්හි ප්‍රමාණය ප්‍රකට කරන ආකාරය ද ඉගෙනුම් ආධාරක භාවිතය සඳහා නිදසුනකි (සංයුත්ත නිකාය, 2005: 406, 407).

මේ ආදි වශයෙන් බුදුන් වහන්සේ විවිධ අවස්ථාවන්හි ඉගෙනුම් ආධාරක භාවිත කරමින් ධර්මය දේශනා කිරීම, ධර්මය අවබෝධ කරවීම, සිත් සමාධිගත කිරීමට අවස්ථාව සලසා දීම ආදිය සිදු කර ඇති බව පැහැදිලි වේ.

**බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරක නූතන අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගත හැකි ආකාරය**

නූතන මනෝවිද්‍යාඥයන්, දාර්ශනිකයන්, අධ්‍යාපනඥයන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා ඉගෙනුම් ආධාරක භාවිතය පිළිබඳ අවධානය යොමු කර ඇත.

එඩ්ගා ඩේල්ගේ අත්දැකීම් කේතුව තුළින් ආධාරක භාවිතයේ වැදගත්කම පැහැදිලි වේ. එහි දැක්වෙන පරිදි වැඩිම තීව්‍රතාවක් සහිත අවස්ථාව වන්නේ සංයුක්ත අත්දැකීම්ය. සංයුක්ත අත්දැකීම් (Concrete Experience) යනු පසිඳුරන් මගින් සංවේදන

ලබා දෙන අත්දැකීම් ය. වියුක්ත අත්දැකීම් (Abstract) යනු තීව්‍රතාව අවම ඒවා වේ. Figure 1ට අනුව මෙහි අත්දැකීම් වර්ග 11ක් පෙළ ගස්වා ඇති අතර එය කොටස් 3ක් යටතේ දක්වා ඇත (Lee & Reeves, 2007).

1. පළමුවැනි කාණ්ඩය - ක්‍රියාකාරී අත්දැකීම් (Direct purposeful Experience)
2. දෙවැනි කාණ්ඩය - ප්‍රදර්ශන අත්දැකීම් (Iconic Experience)
3. තුන්වැනි කාණ්ඩය - සංකේතීය අත්දැකීම් වශයෙනි. (Symbolic Experience)

මෙහි පහළ සිට ඉහළට සංයුක්ත අත්දැකීම්වල තීව්‍රතාව ක්‍රමානුකූලව අවම වේ. ඒ අනුව ඉහළ ම ඇති අත්දැකීම් වියුක්ත අත්දැකීම් වේ.





Figure 1 - Dale's Cone of Experience

මෙම රූප සටහනට අනුව සංයුක්ත අත්දැකීම් තුළින් ශිෂ්‍යයාගේ ඉගෙනීම ඵලදායී වන අතර ම වියුක්ත අත්දැකීම් හරහා ලබන ඉගෙනුම ඵලදායීතාවෙන් අවම වන බව පැහැදිලි වේ. ආධාරක භාවිතය අත්දැකීම් වර්ධනයට හේතු වන නිසාවෙන් නූතන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ඉගෙනුම් ආධාරක භාවිතය අත්‍යවශ්‍ය අංගයක් වී ඇත.

ශිෂ්‍යයාගේ ඉගෙනීම රස වින්දන, ස්පර්ශන, ආඝ්‍රාණ, ශ්‍රවන හා දර්ශනය යන සංවේදනයන් ඔස්සේ සිදු වන බව කෝබන් විසින් 1968 වර්ෂයේ (Cobun, 1968) සිදු කරන ලද පර්යේෂණයකින් අනාවරණය කර ඇති බව Yakwal and Tashi (2007) දක්වා ඇත. එහි දී ශිෂ්‍යයා තොරතුරු ග්‍රහනය කර ගන්නා ආකාරය ප්‍රතිශතාත්මකව පහතින් දැක් වේ.

- සියයට 1.0ක් රස වින්දනයෙනුත්
- සියයට 1.5ක් ස්පර්ශයෙනුත්
- සියයට 3.5ක් ආඝ්‍රාණයෙනුත්
- සියයට 11.0ක් ශ්‍රවණයෙනුත්
- සියයට 83.0ක් දර්ශනයෙනුත්

ලබා ගන්නා අතර ඉන් මතකයට එකතු වන ප්‍රමාණය ද එකිනෙක වෙනස් වේ.

මීට අමතර ව රිචඩ් රයිඩින්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය (තිලරත්න බණ්ඩා, 2007: 25, 26), ජී. ක්ලැක්ස්ටන්ගේ ඉගෙනුම් ප්‍රවේශ (තිලරත්න බණ්ඩා, 2007: 27, 28), රෙග් රේවන්ස්ගේ ආනුභූතික ඉගෙනීම (තිලරත්න බණ්ඩා, 2007: 29), ඩේවිඩ් කෝල්බ්ගේ ඉගෙනුම් ශෛලිය (තිලරත්න බණ්ඩා, 2007: 33, 34), ෆෙරන්ස් මාර්ටන්ගේ පෘෂ්ඨීය ඉගෙනීම හා අගාධිය ඉගෙනීම (තිලරත්න බණ්ඩා, 2007: 35, 36) ආදි වූ විවිධ මනෝවිද්‍යාඥයන්ගේ, දාර්ශනිකයන්ගේ, අධ්‍යාපනඥයන්ගේ විවිධ ඉගෙනුම් ශෛලීන්වලට අනුව ඉගෙනුම් ආධාරකවලට සුවිශේෂ තැනක් ලැබෙන බව අනාවරණය වේ.

මේ ආදි කරුණු නිසාවෙන් ඉගෙනුම් ආධාරක, වර්තමානයේ ඉතා ප්‍රචලිත ඉගෙනුම් ඉගැන්වීම් මෙවලමක් බවට පත්ව ඇති බව දාර්ශනික මත හරහා ද පැහැදිලි වේ.

බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරක අධ්‍යාපන පද්ධතියට යොදා ගත හැකි ආකාරය ප්‍රධාන කරුණු තුනක් යටතේ දැක්විය හැකිය.

- භාවිත කිරීමේ මූලික අරමුණු
- භාවිත කරන ලද ඉගෙනුම් ආධාරක හා අවස්ථා
- ඉගෙනුම් ආධාරකවල සුවිශේෂතාවයන්
- භාවිත කිරීමේ මූලික අරමුණු

බුදුන් වහන්සේ විසින් ධර්ම සන්නිවේදනයේ දී ඉගෙනුම් ආධාරක විවිධ අරමුණු පාදක කර ගෙන භාවිත කර ඇත.

- අර්ථය හැඟවීමට,
- ඥානය වහා වර්ධනය කරවීමට,
- යමක් ඉස්මතු කරලීමට,
- දේශනය සිත් ගන්නා සුළු වීමට,
- නොදන්නා දේ වඩාත් විග්‍රහ කිරීමට,
- පෙළඹවීමක් ඇති කිරීමට,
- අවධානය දිනා ගැනීමට,
- ගැඹුරු කරුණු සරලව ඉගැන්වීමට,
- ස්වයං අත්දැකීම් ආශ්‍රයෙන් ස්වයං අවබෝධය සිදු කිරීමට

**භාවිත කරන ලද ඉගෙනුම් ආධාරක හා අවස්ථා**

බුදුන් වහන්සේ භාවිත කරන ලද ඉගෙනුම් ආධාරක පෙර සකස් කරන ලද ඉගෙනුම් ආධාරක නොව අවට පරිසරයේ ඇති ඉගෙනුම් ආධාරකයි. අවස්ථාවෝචිත ව සජීවී ආධාරක භාවිතය එහි දී කැපී පෙනේ. ගංගාවක් සමීපයේ සිටි අවස්ථාවක දී ආධාරකය බවට පත් වූයේ ජලය යි. සොහොන් බිමක දී ආධාරකය මෘත දේහය යි. කුඹුරක දී කෙත හා එහි ඇති සම්පත් ද ආදි වශයෙන් විශේෂයෙන් සකස් කර නොගත් ඉගෙනුම් ආධාරක භාවිතය සුවිශේෂ ය. එවැනි ආධාරක වර්තමාන පාසල් අධ්‍යාපනය තුළ යොදා ගැනීම හරහා අවම පිරිවැයකින් ඵලදායී අධ්‍යාපනයක් ලබා දීමට හැකි ය.

එමෙන් ම බුදුන් වහන්සේ අවශ්‍ය අවස්ථාවල දී පුද්ගල මානසිකත්වයන් අවබෝධ කර ගනිමින් ඒ මානසිකත්වයට අනුව ආධාරක භාවිත කර ඇත. චුල්ලපන්ථක හිමිට පිරිසිදු රෙදිකඩක් ආධාරයෙන් ධර්මාවබෝධය ලබා දීම, නන්ද කුමාරයාට රුවැති ස්ත්‍රියක් මවා ක්‍රමානුකූලව වැහැරුණු ශරීරය ඇති කුණු දුගඳ පැතිරෙන කාන්තාවක් බවට ඇය පත් කොට ජීවිතයේ අනියත බව පසක් කරවීම, රාහුල හිමියන්ට ගෙනා පැන් භාජනය ආධාරකයක් බවට පත් කිරීම, ඛේමා තෙරණියට අනියත බව පැහැදිලි කිරීම සඳහා රූමත් කාන්තාවක් මවා වෙනස්වන ස්වභාවය පැහැදිලි කිරීම ආදි වශයෙන් ඒ ඒ පුද්ගල මානසිකත්වයන්ට ගැළපෙන අයුරින් ඉගෙනුම් ආධාරක භාවිත කර ඇත. ඒ අනුව නූතන ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පුද්ගල මානසිකත්වය හඳුනා ගෙන ඒ අනුව ඉගෙනුම් ආධාරක යොදා ගැනීම මෙයින් ගත හැකි ආදර්ශයකි.

- ශිෂ්‍යයා අවට පරිසරයට ගෙන ගොස් පරිසරයේ ඇති ද්‍රව්‍යයන් ආධාරක ලෙස භාවිතය
- ශිෂ්‍ය අත්දැකීමක් භාවිත කරමින් එය ආධාරකයට ගැනීම
- වීඩියෝ පට වැනි රූප ගත කළ දර්ශන භාවිතයට ගැනීම
- අවස්ථෝචිතව සිද්ධි හා අවස්ථා සම්පාදනය කරදීම
- පංති කාමරය තුළ ඇති යම් යම් ද්‍රව්‍යයන් උපයෝගී කර ගැනීම
- ඉගෙනුම් අවස්ථාවට පෙර සකස් කරන ලද ද්‍රව්‍යයන් භාවිත කිරීම
- ඉගෙනුම් ආධාරකවල සුවිශේෂතාවන්

ඉහත ඉගෙනුම් ආධාරක වර්ග යන තේමාව යටතේ නූතනයේ භාවිත වන ඉගෙනුම් ආධාරක හඳුනාගත හැකි ය. එම ආධාරක සැකසීම සඳහා ගුරුවරුන්ට වැඩි ශ්‍රමයක් වැය කිරීමට සිදු වීම, අධික මුදලක් වැය වීම, සකස් කිරීමට වැඩි කාලයක් ගත කිරීමට සිදු වීම, අවශ්‍ය සම්පත් නොමැති වීම, සකස් කර ගත් ඉගෙනුම් ආධාරක ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන මෙවලම් මිළ දී ගැනීම සඳහා වැඩි වියදම් දැරීමට සිදු වීම ආදි වූ ගැටලුවලට ගුරුවරුන්ට මුහුණ දීමට සිදු වන අතර ඒවා වළක්වා ගැනීමට බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ආධාරකවලින් ආදර්ශ ගත හැකි ය.

- අවට පරිසරයේ ඇති ඉගෙනුම් ආධාරක භාවිත කිරීම
- අතිරේක කාලයක් ගත නොවීම
- අතිරේක වියදම් නොවීම
- අවශ්‍ය ඕනෑම අවස්ථාවක යොදා ගැනීමේ හැකියාව
- අවස්ථාවට ගැළපෙන ලෙස භාවිතය

**සමාලෝචනය**

මෙම පර්යේෂණයේ දී අනාවරණය වූ කරුණු අනුව ඉගෙනුම් ආධාරක යනු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ඵලදායිතාව ඉහළ මට්ටමක තබා ගැනීම සඳහා ගුරුවරුන් විසින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කරන ද්‍රව්‍ය හෝ මෙවලම් ය. දෘශ්‍යාධාරක, ශ්‍රව්‍යාධාරක හා ශ්‍රව්‍ය-දෘශ්‍ය ආධාරක වශයෙන් භාවිත කරන උපකරණයේ ස්වභාවය අනුව වර්ගීකරණයක් හඳුනාගත හැකි ය. එම ආධාරක භාවිතයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට හැකියාව ලැබේ. නිතර නිතර අමතක වීමේ ප්‍රවණතාවක් ඇති සිසුන්ට සංකල්ප වඩාත් ස්ථිරව හා පහසුවෙන් රඳවා ගැනීමට උපකාර වීම, ඉගෙනුම් ආධාරක භාවිතයෙන් ඉගෙනීම හරහා ශිෂ්‍යයා පෙළඹවීමට ලක් කළ හැකි වීම, ඉගැන්වීමට නියමිත කරුණු පිළිබඳ ගැඹුරු අවබෝධයක් වර්ධනය කිරීම, මනසෙහි නිසි ප්‍රතිරූපයක් නිර්මාණය කිරීමෙන් සිසුන්ගේ අවබෝධ මට්ටම ඉහළ නැංවීම, සිසුන්ගේ වැඩි ප්‍රමාණයකට සංකල්පීය චින්තනය වැඩි කිරීමට, ඉගෙනීම වේගවත් හා නිවැරදි කිරීමට, සැබෑ අත්දැකීම් වර්ධනය කර ගැනීමට, යම් සංකල්පයක් පැහැදිලි කිරීමට, ගතවන කාලය ඉතුරු කර ගැනීම හරහා කාලය ඵලදායී ලෙස භාවිත කිරීමේ හැකියාව ආදි වූ වැදගත්කම් රාශියක් ඉගෙනුම් ආධාරක භාවිතයෙන් ලබා ගත හැකි බව අනාවරණය විය. එය විවිධ දාර්ශනිකයන්, මනෝවිද්‍යාඥයන්, අධ්‍යාපනඥයන් දක්වන මතවලින් ද තහවුරු වේ.

එලෙස ම නූතන අධ්‍යාපනඥයන්ට පෙර මින් වසර 2500 ප්‍රථම ව ඉගෙනුම් ආධාරක භාවිත කළ සුවිශේෂ අධ්‍යාපනඥයෙක් ලෙස බුදුන් වහන්සේ පෙන්වා දිය හැකිය. උන්වහන්සේ භාවිත කළ ආධාරක ලෙස ස්වභාව සෞන්දර්ය යොදා ගැනීම, සුවිශේෂ වූ යම් ද්‍රව්‍යයක් උපකාර කර ගැනීම, එම අවස්ථාවට සම්බන්ධ වූ යම් යම් ද්‍රව්‍යයන් හා යම් යම් සිද්ධි ආධාරකය ලෙස යොදා ගැනීම, බුදුන් වහන්සේට ආවේණික වූ යම් මනඃකල්පිත කතා වස්තුවක් ඍද්ධි බලයෙන් පෙන්නුම් කිරීම ආදිය දැක්විය හැකිය. එම ඉගෙනුම් ආධාරකවල සුවිශේෂත්වයන් ලෙස එක් එක් පුද්ගලයන්ට ගැළපෙන පරිදි, අවස්ථාවෝචිතව, සජීවී ඉගෙනුම් ආධාරක භාවිත කර ඇති ආකාරය ද හඳුනාගත හැකි විය. ඒ අනුව නූතනයේ දාර්ශනිකයන් ඉගෙනුම් ආධාරක හඳුන්වා දෙන පසුබිමක බුදුන් වහන්සේ මින් ශත වර්ෂ 25ට පමණ පෙර එම ආධාරක ප්‍රායෝගිකව භාවිත කළ ආකාරයත් උක්ත කරුණු තුළින් පැහැදිලි වේ.

එම ඉගෙනුම් ආධාරක නූතන අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා ද භාවිත කළ හැකි අතර ඒවා භාවිත කිරීමෙන් වැඩි ශ්‍රමයක් වැය කිරීමට සිදු වීම, අධික මුදලක් වැය වීම, සකස් කිරීමට වැඩි කාලයක් ගත කිරීමට සිදු වීම, අවශ්‍ය සම්පත් නොමැති වීම, සකස් කර ගත් ඉගෙනුම් ආධාරක ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන මෙවලම් මිළදී ගැනීම සඳහා වැඩි වියදම් දැරීමට සිදු වීම ආදි වූ ගැටලුවලින් නිදහස් විය හැකිය. ශිෂ්‍යයා අවට පරිසරයට ගෙන ගොස් පරිසරයේ ඇති ද්‍රව්‍යයන් ආධාරක ලෙස භාවිතය, ශිෂ්‍ය අත්දැකීමක් භාවිත කරමින් එය ආධාරකයට ගැනීම, වීඩියෝ පට වැනි රූප ගත කළ දර්ශන භාවිතයට ගැනීම, අවස්ථානෝචිතව සිද්ධි හා අවස්ථා සම්පාදනය කර දීම, පංති කාමරය තුළ ඇති යම් යම් ද්‍රව්‍යයන් උපයෝගී කර ගැනීම, ඉගෙනුම් අවස්ථාවට පෙර සකස් කරන ලද ද්‍රව්‍යයන් භාවිත කිරීම ආදි ආකාරයෙන් නූතන අධ්‍යාපනය සඳහා බුදුන් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ඉගැන්වීම් ආධාරක යොදා ගත හැකි බව මෙම පර්යේෂණයේ නිගමනය යි.

## ආශ්‍රිත මූලාශ්‍ර නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


අපදාන පාළිය, එකූපොසථිකවග්ගො, කිසාගෝතමී අපදාන (2005). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අපදාන පාළිය, එකූපොසථිකවග්ගො, ඛෙමාපදානය (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අපදානපාළිය, කුණ්ඩලකේසිවග්ගො, නන්දා ජනපදකල්‍යාණී අපදානය (2005). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අපදානපාළිය, සීහාසනදායකවග්ගො, චුල්ලපන්ථකත්ථෙරස්සාපදානං (2005). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අංගුත්තරනිකාය, දසක නිපාතො, මහාවග්ගො, කසිණ සුත්තං (2005). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අංගුත්තරනිකාය (2006). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බුද්දකනිකාය, සුත්ත නිපාත, උරගවග්ග, කසීභාරද්වාජ සූත්‍රය (2005). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දීඝනිකාය II, මහාසතිපට්ඨානසුත්තං (2005). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිමනිකාය II, භික්ඛු වග්ගො, අම්බලට්ඨික රාහුලෝවාද සුත්තං (2005). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සංයුත්තනිකාය, ඔපම්ම සංයුත්ත, නඛ සිඛා සූත්‍රය (2005). (බු.ජ.මු.) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.


### ද්විතීයික මූලාශ්‍රය


තිලරත්න බණ්ඩා, ඩී.එම්. (2007). අධ්‍යාපනික තාක්ෂණ විද්‍යාව. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. (1989). ඉගැන්වීමේ ක්‍රම ශිල්ප. නුගේගොඩඃ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

Anderson, Heidi Milia. “Dale’s Cone of Experience”, https://www.queensu.ca/teachingandlearning/modules/active/documents/Dales_Cone_of_Exp erience_summary.pdf, (Accessed on Feb 13, 2021).

Cobun, T.C. (1968). Media and public school communication in instructional process and media innovation. Ram: McNally.

Kapur, S. (2018). Teaching Aids: Non-conventional and Modern. Pathshala, Ministry of Human Resource Development (MHRD), Government of India. Retrieved from ResearchGate: http://www.researchgate.net/publication/327971438_Teaching_Aids_Nonconventional_and_Modern.

Lee, S. J., & Reeves, T. C. (2007). Edgar Dale: A significant contributor to the field of educational technology. Educational Technology, 47(6), 56–59. https://lidtfoundations.pressbooks.com/chapter/edgar-dale-and-the-cone-of-experience/

Sudhakar, J. (2017). Teaching aids and resources: Aids to the best learning. LinkedIn. https://www.linkedin.com/pulse/teaching-aids-resources-best-learning-ms-jemi- sudhakar

Tomić, D., Rastovski, D., & Ćurić, M. (2023). Exploring the VARK model: A review of the validity and reliability of the questionnaire and its relationship to learning outcomes. International Journal of Educational Research, xx(x), xxx–xxx.

Ordu, U. B.-A. (2021). New challenges to education: Lessons from around the world. In BCES Conference Books (Vol. 19). Sofia, Bulgaria: Bulgarian Comparative Education Society. https://doi.org/ (if available)

UGCNETPaper1 Team. (2019). Teaching aids. UGCNETPaper1. https://ugcnetpaper1.com/teaching-aids/

Yakwal, S. M., & Tashi, L. I. (2021). Establishing a practical library for the visually impaired. LWATI: A Journal of Contemporary Research, 4, 30–38. https://www.ajol.info/index.php/lwati/issue/view/5252